ආදරණීය දුවේ පුතේ,

- පහත සඳහන් කොටුවේ ඇති <u>මම</u> යන උක්තය යෙදුණු වාක්‍ය වර්තමාන කාල වාක්‍ය සහ අතීත කාල වාක්‍ය ලෙස වෙන් කරන්න.

මම මල් පැළයක් ගෙන ආවෙමි.
මම මල් පැළයක් සිටුවමි.
මම මල් පැළයට වතුර දැමුවෙමි.
මම මල් පැළයට පොහොර දමමි.
මම මල් පැළය අවට පිරිසිදු කළෙමි.
මම මල් පැළය වැඩෙන අයුරු බලා සිටිමි.
මම මල් පැළයේ මල් පිපී තිබෙනු දුටුවෙමි.
මම පිපුණු මල් බලා සතුටු වෙමි.

වර්තමාන කාලය	අතීත කාලය

- පහත දී ඇති වාක්‍යවලට මම යන උක්තය යෙදුණු වර්තමාන කාල වාක්‍ය හෝ අතීත කාල වාක්‍ය වෙන්කර ලියන්න

දොළෙහි අසිරිය

වත්ත පහළ දොළෙහි වතුර ගලන ශබ්දය මගේ සිත අවදි කළේ ය. දිය පහර වේගයෙන් පහළට ගලා යයි. විවේකයක් ලද විගස මම වත්ත පහළට යමි. එහි ගොස් මම දිය පහර ගලා යන ආකාරය ආශාවෙන් බලා සිටිමි. මම ගලක් උඩ වාඩි වුණෙමි. දොළ පහරේ වේගය දැන ගැනීමට මම කකුල් දෙක වතුරට දැමුවෙමි. මට අධික සීතලක් දැනුණි. දොළෙහි ඇති කුඩා ගල්, යම් ප්‍රමාණයක විශාල ගල් මෙතරම් මටසිලුටු වී ඇත්තේ දොළ පහරේ වතුර ගලන වේගයට යැයි මම ස්ථිරව ම දැන ගතිමි. මම දොළෙහි පීනන මාළුන් දෙස බලමි. දොළෙහි වතුර ගලන වේගයට විරුද්ධ ව ඔවුන් පීනන ආකාරය ද මම බොහෝ වේලාවක් බලා සිටියෙමි. ස්වභාව සෞන්දර්යයේ අපූර්ව නිර්මාණයක් වූ දොළ පාරේ අසිරිය මම රිසි සේ විඳිමි. මම ඒ අසිරිය විඳගැනීමට වාසනාවන්ත වූවෙමි.

වර්තමාන කාලය	අතීත කාලය